මෙලොවෙහි කාන්තාවක් තම සැමියාට හිංසා නොකළ යුතුය. එවිට දැකුම්කළු (ස්වර්ග) ලලනාවන් අතුරින් වූ ඔහුගේ (ස්වර්ග) බිරිය, “ඔබ ඔහු පීඩාවට පත් නොකරනු. අල්ලාහ් ඔබට ශාප කරත්වා! සැබැවින්ම ඔහු ඔබ අබියස අමුත්තෙකු පමණි. ඔහු ඔබෙන් වෙන් වී අප වෙත ඉතා සමීපයෙන් පැමිණෙනු ඇත.“ යැයි පවසනු මිස නැත.

මුආද් ඉබ්නු ජබල් -රළියල්ලාහු අන්හු- තුමා විසින් වාර්තා කරන ලදී. මෙය මර්ෆූඃ ගණයට අයත් හදීසයකි. “මෙලොවෙහි කාන්තාවක් තම සැමියාට හිංසා නොකළ යුතුය. එවිට දැකුම්කළු (ස්වර්ග) ලලනාවන් අතුරින් වූ ඔහුගේ (ස්වර්ග) බිරිය, “ඔබ ඔහු පීඩාවට පත් නොකරනු. අල්ලාහ් ඔබට ශාප කරත්වා! සැබැවින්ම ඔහු ඔබ අබියස අමුත්තෙකු පමණි. ඔහු ඔබෙන් වෙන් වී
අප වෙත ඉතා සමීපයෙන් පැමිණෙනු ඇත. යැයි පවසනු මිස නැත.“ [පූර්ව සාධක සහිත හදීසයකි] [ඉබ්නු මාජාහ් එය වාර්තා කර ඇත - ඉමාම් තිර්මිදි එය වාර්තා කර ඇත - අහ්මද් එය වාර්තා කර ඇත]

මෙලොවෙහි බිරියක් තම සැමියා වේදනාවට පත් කිරීමෙන් නබි -සල්ලල්ලාහු අලය්හි වසල්ලම්- තුමා වැළැක්වූහ. නියත වශයෙන්ම එම සැමියා මෙලොවෙහි ආගන්තුකයෙකි, අමුත්තෙකි. ඉතා සමීපයෙන් මෙලොවින් සමුගෙන මතුලොවට ගමන් කරනු ඇත. ඔහු ස්වර්ගයට ඇතුල් වී මතුලොවෙහි ස්වර්ග කන්යාවියන්ගේ භාග්යයට හිමි වනු ඇත.

https://sunnah.global/hadeeth/si/show/5822